# 2023/07/27 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/07/27 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්ද්‍රිම මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/07/13 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

   a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | කළමනාකරු, ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම, යුනියන් පෙදෙස, කොළඹ 02 - ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් අවශ්‍ය උපාංග මිලදී ගැනීම සඳහා ගෙවීම. | 43,955.35 | නිර්දේශ කරන ලදී. |
| 02. | වයි.එම්.නුවන් හර්ෂණ මයා, රියදුරු, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ලබා දුන් UPKH-8201 ජීප් රථය 2023/07/14 දින සභාව වෙත රැගෙන ඒම සඳහා ලබා ගන්නා ලද ඉන්ධන සඳහා අතින් දරන ලද වියදම් පියවීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | සී/ස ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, බදුල්ල - A4 පැකට් 25ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම.(බිල්පත් අංකය - 4971) | 43,750.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | කළමනාකරු, මැග්වින් ට්‍රේඩ් සෙන්ටර්, ගුරුන්දුවත්ත පාර, බදුල්ල - කාර්යාලීය අවශ්‍යතා සඳහා පිටු 80CR හා පිටු 120CR පොත් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංකය - 5208) | 3,800.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | ටෙරන්ස් නෙතුමිණ මයා, ලයන් මෝටර්ස්, ජේරගස්වත්ත, මීගහකිවුල - 2023.04.30 දින නව බස් නැවතුම්පොළ භූමියේ පැවැත්වූ සංගීත ප්‍රසංගය සඳහා තැම්පත් කළ රැඳවුම් මුදල නිදහස් කිරීම. | 5,000.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | කළමනාකරු, රත්න සුපර් සිටි, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශිය සභාවේ වැසිකිලිය අළුත්වැඩියා කිරීමට හා මීගහකිවුල ජල යෝජනා ක්‍රමයේ නළ අළුත්වැඩියා කිරීම සඳහා මිලදී ගත් ද්‍රව්‍ය වලට මිළ ගණන් පියවීම.(ශොකට්, ත්‍රෙඩ් සීල්, බිග් ටැප්.බිල්පත් අංකය - 0632) | 3,070.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | කළමනාකරු, අයි.එස්.මාකටින්, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රදේශිය සභා කාර්යාලයේ අවශ්‍යතාවයන් සඳහා මිළදී ගත් බල්බ් වල මිළ ගණන් පියවීම.(බිල්පත් අංකය - 387) | 4,800.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | කළමනාකරු, රත්න සුපර් සිටි, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල | 2,950.00 | නිර්දේශ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය සභාව සතු වෙලන්ලන්ද ජල යෝජනා ක්‍රමයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් පියවීම.(සිමෙන්ති, ඉබියතුරු,පට්ටම්,බිල්පත් අංකය - 0640) | | කරන ලදී. |
| 09. | කළමනාකරු, රත්න සුපර් සිටි, නුවර පාර, මීගහකිවුල -මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කරමැටිය සතිපොලේ කඩ කාමර සඳහා අවශ්‍ය ඉබි යතුරු මිළදී ගැනීම සඳහා මිළ ගණන් පියවීම.(බිල්පත් අංකය - 0625) | 4,950.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | කළමනාකරු, පුබුදු කොන්ක්‍රීට් ඇන්ඩ් හාඩ්වෙයාර්, කෙසෙල්වත්ත, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ CCTV කැමරා සවි කිරීමට හා ජල පිරිපහදු ඒකකය සඳහා අවශ්‍ය වයරින් බඩු මිළ ගණන් පියවීම.(ප්ලග් ඇන්ඩ් ස්විච්, සන් බොක්ස්) | 8,560.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | අයි.එස්.මාකටින්, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු CCTV කැමරා සවි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් පියවීම.(සන් බොක්ස්, බිල්පත් අංකය - 2885) | 600.00 | නිර්දේශ කරන ලදී. |
| 12. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023.07.08 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගත් NB-4790 වෑන් රථයට බදුල්ලේ සිට මීගහකිවුල පැමිණීමට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් අතින් දරන ලද මුදල් ගෙවීම.( මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිරීක්ෂණය කිරීම සඳහා කුලියාපිටියට යාම සහ ඒම සඳහා සම්පූර්ණ දුර ප්‍රමාණය කිලෝමීටර් 462කි. ඒ අනුව මෙම වාහනයේ ලීටර් 01කින් කිලෝමීටර් 07ක් ගමන් කල හැකිය. අතින් වියදම් දරා ඉන්ධන ලීටර් 10ක් සහ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ඇණවුමෙන් ලීටර් 55ත් සමඟ ගමන සඳහා යොදා ගත් සම්පූර්ණ ඉන්ධන ලීටර් ප්‍රමාණය 65කි. ඒ අනුව ගමනේ සම්පූර්ණ දුර ප්‍රමාණය අනුව ඉන්ධන ලීටර් 66ක් ඉන්ධන භාවිතා වුවත් මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ඉන්ධන ලීටර් 65කට පමණක් වියදම් දරා ඇත.) | 3,080.00 | නිර්දේශ කරන ලදී. |
| 13. | ටී.එම්.ඩී.එම්.කුමාරිහාමි මිය, සංවර්ධන නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - EHRM ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා ඌව පළාත් ශ්‍රවණාගාරයට යාම වෙනුවෙන් 2023 ජූලි මස ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 14. | ඩී.එම්.කීර්ති උපනන්ද මයා, ක්ෂේත්‍ර කම්කරු, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා ඌව කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2023 ජූලි මස ගමන් විදම් ගෙවීම. | 3,260.00 | නිර්දේශ කරන ලදී. |
| 15. | පී.එච්.ගුණරත්න මයා, රියදුරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව - මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිරීක්ෂණය කිරීම සඳහා කුලියාපිටියට යාම වෙනුවෙන් 2023 ජූලි මස ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |
| 16. | ඩී.එම්.අනුෂා ශ්‍යාමලී මිය, මාර්ග කම්කරු, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පළාත් පාලන මහජන පුස්තකාල සේවක/සහයක කම්කරු පුහුණුව සඳහා බදුල්ල පුස්තකාල සේවා මණ්ඩලයට යාම වෙනුවෙන් 2023 ජූලි මස ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 17. | ආර්.එම්.පී.අශෝකා මිය, පුස්තකාල සහයක - පළාත් පාලන මහජන පුස්තකාල සේවක/සහයක කම්කරු පුහුණුව සඳහා බදුල්ල පුස්තකාල සේවා මණ්ඩලයට යාම වෙනුවෙන් 2023 ජූලි මස ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 18. | එස්.එම්.ඒකනායක බණ්ඩා මයා, ආදායම් පරීක්ෂක(වැ.බ.) – 2023 | 2,500.00 | නිර්දේශ |

| | | | |
|---|---|---|---|
| | ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | | කරන ලදී. |
| 19. | පී.එච්.ගුණරත්න මයා, රියදුරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව - මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ නිරීක්ෂණය කිරීම සඳහා කුලියාපිටියට යාම වෙනුවෙන් 2023 ජූලි මස අතිකාල දීමනා ගෙවීම. | 2,594.92 | නිර්දේශ කරන ලදී. |
| 20. | ඩී.එම්.ජේමාවතී මිය, මහජන පුස්තකාලය, පිටමාරුව - 2023 වර්ෂයේ මැයි සහ ජුනි මස වල පිටමාරුව සතිපොළ බදු මුදල් එකතු කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 21. | එම්.එස්.එන්.ඉට් සොලූෂන්ස්, නො.287/4, පහළ වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ටෝෂිබා ඡායා පිටපත් යන්ත්‍රය සඳහා අවශ්‍ය ටෝනර් සඳහා මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 47,600.00 | නිර්දේශ කරන ලදී. |
| 22. | කළමනාකරු, තව්දු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල/ කළුගහකඳුර/ පිටමාරුව පුස්තකාල වලට මැයි හා ජුනි මස ගත් පුවත්පත් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 29,140.00 | නිර්දේශ කරන ලදී. |
| 23. | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023/03/19 දිනෙන් පසු සභා ලේකම් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් 2023 ජුනි මස මාසික දීමනා ගෙවීම. | 20,000.00 | නිර්දේශ කරන ලදී. |
| 24. | ලංකාවේ සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - 2024 අයවැය සැකසීම වෙනුවෙන් සංවර්ධන යෝජනා ලබා ගැනීමට මහජනතාව වෙත දැන්වීම සඳහා පුවත්පත්හි පළ කිරීම. | 36,570.00 | නිර්දේශ කරන ලදී. |
| 25. | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පසුගිය පැවති 2022/07/13 කළමනාකරණ කමිටුව හා ප්‍රසම්පාදන කමිටු දීමනා ගෙවීම. | 11,000.00 | නිර්දේශ කරන ලදී. |
| 26. | ඩී.එම්.පැතුම් මනෝජ් මයා, වික්ටරි, නුවර පාර, මීගහකිවුල - කසල බැහැර කිරීම සම්බන්ධව ස්ටිකර් ප්‍රින්ට් එකක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංකය - 0538) | 1,150.00 | නිර්දේශ කරන ලදී. |
| 27. | අයි.එස්.මාකටින්, නුවර පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහලේ අලුත්වැඩියා කටයුතු සඳහා මිලදී ගත් ද්‍රව්‍යයන් වලට මිල ගණන් පියවීම.(සිමෙන්ති, පොට් මිටි, වැලි කඩදාසි,බිල්පත් අංකය - 318) | 3,550.00 | නිර්දේශ කරන ලදී. |
| 28. | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 74,844.00 | නිර්දේශ කරන ලදී. |
| 29. | කළමනාකරු, වික්‍රම ටයර් ඇන්ඩ් ඔයිල් සෙන්ටර් - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ZA-5003 බැකෝ ලෝඩරය සඳහා ලබා ගත් ග්‍රීස් ප්‍රමාණවත් නොවීම නිසා නැවත ග්‍රීස් 1Kg ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 3,500.00 | නිර්දේශ කරන ලදී. |
| 30. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023.07.22 ඔහිය පුහුණු මධ්‍යස්ථානය පැවති පුහුණුව සඳහා යෑම සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයේ වෙතින් ලබා දුන් 57-9445 රථයට ඉන්ධන ලීටර් 20L යෙදීම වෙනුවෙන් අතින දරන ලද මුදල් ගෙවීම. | 6,160.00 | නිර්දේශ කරන ලදී. |

b. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

c. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ජල පිරිපහදු ඒකකය වැඩි දියුණු කිරීම සඳහා වැඩ කල කම්රුවන්ගේ චෙක්රෝල් මත වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කාර්යාල මේස 15ක් සඳහා මේස රෙදි අවශ්‍ය වී ඇති අතර පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මේස රෙදි ලබා ගැනීම සඳහා අපේක්ෂා කර ඇත. මේ සඳහා කළමණාකරණ කමිටුවේ අනුමැතියද ලබා ගෙන ඇත. මේ වන විට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ අප ආයතනය වෙත අවශ්‍ය එකම වර්ගයේ මේස රෙදි 15ක් ලබා ගැනීමට නොමැති අතර අලුතින් මේස රෙදි 15ක් සකස් කර ගැනීමේදී මේස රෙදි එකක් සඳහා ඇස්තමේන්තු මුදල රු.3,000.00ක් පමණ වන බැවින් කන්දකැපුඋල්පත පේෂ කර්ම මධ්‍යස්ථානයෙන් ඇඳ රෙදි මිලදී ගෙන මේස රෙදි සකස් කර ගැනීමට තීරණය කරන ලද අතර එහිදී මේස රෙදි එකක් සඳහා වැයවනුයේ රු.1,540.00කි. ආයතනයේ සියලුම මේස රෙදි අවශ්‍යතාවය සඳහා ඇඳ රෙදි 07ක් අවශ්‍ය වන අතර (මීටර් 17.5) ඒසඳහා වැයවන රු.26,950.00ක මුදල දරා කාර්යාල මේස රෙදි සකස් කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ DELL වර්ගයේ පරිගණක යන්ත්‍රය අක්‍රිය වී ඇති බව එම පරිගණක භාවිතා කරන ආර්.ඩබ්.එම්.නිලූෂා ප්‍රියදර්ශනි නිලධාරිනිය වාචිකව ප්‍රකාශ කර ඇති අතර, එම පරිගණකය අළුත්වැඩියා කර ගැනීමට හා මිළ ගණන් කැඳවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනෙන් අවසන් භාණ්ඩ සමීක්ෂණයෙන් නිර්දේශ වලට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසිය තුලින් රු:70,743.43 මුදලක් ලැබී ඇත. ඒ අනුව එම ආදායම යොදවා කාර්යාලයේ ගබඩාව ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

V. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පිටමාරුව මහජන පුස්තකාලයේ 2006 වර්ෂයට පෙර හා 2006-2020 අතර කාලය තුල පොත් 44 අස්ථානගත වී ඇත. 2006 වර්ෂයට පෙර පොත් 30ක්ද 2006-2020 අතර කාලයේදී පොත් 14ක්ද අස්ථානගත වී ඇති බව දැනට පුස්තකාලයේ සේවය කරන ඩී.එම්.ජේමාවතී මහත්මිය විසින් ලිඛිතව දැනුම් දී ඇත. එම පොත් 44න් 14ක් ඩබ්.එම්.තිලකාවතී මහත්මිය සේවය කරන කාලය තුලදී අස්ථානගත වී ඇත. එම පොත් 14න් මිළ ගණන් සඳහන් පොත් 09 සඳහා රු:1,112.50 ක මුදලක් ඇය විසින් සභාව වෙත ගෙවා ඇත. 2006 වර්ෂයට පෙර නැතිවූ පොත් 30 පමණක් කපා හැරීමට 2022/11/21 ගරු මහ සභාවේ අනුමැතිය ලබා දී ඇත. 2006-2020 අතර කාලයේදී අස්ථානගත වූ පොත් වලින් මිළ ගණන් සඳහන් කර නොමැති ඉතිරි පොත් 05 සඳහා මිළ ගණන් ලබා ගැනීමට මිළ කමිටුවක් පත් කර ගැනීම හා 2016/12/22 දිනැතිව නිකුත් කරන ලද අංක:2004 පුස 1(2016 සංශෝධිත) දරණ චක්‍රලේඛණයේ 04.1 අදාලව මෙම පොත් කපා හැරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VI. මීගහකිවුල ප්‍රාදේශීය සභවේ 2023 ජුනි මස සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.10.30ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) - Krishantha
2) ඩබ්.ජේ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ජේ.එල්.ජේ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
5) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
6) ජේ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
7) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -